# සිංගරු සිරිත

## උඩු ගං බලා පිහිනන මිනිසකුගේ මතක කෝෂ්ඨාගාරය

ඔවුන් කියවා තේරුම් ගන්නේ ලේඛකයා ලියූ දේ නොව තමන්ට තේරුම් ගන්නට අවශ්‍ය වෙනත් මොකක් හෝ දෙයකි. එපමණකින් නොනැවතී තමන් වැරදි ලෙස වටහා ගත් සටහන් පිළිබඳ මහා හා හෝවක් කරන්නටත් මේ උදවියට හැකිය. එයින් තමන්ගේ නොදැනුවත් බව එළිදරව් වෙන බවවත් තේරුම් ගන්නට තරම් බුද්ධියක් මේ බොහෝ අයට නැත.

ජගත් ජේ එදිරිසිංහ

මම මෙයට වසර දොළහකට දහතුනකට පමණ පෙර සෙරෙන්ඩිබ් නිව්ස් පුවත්පත වෙනුවෙන් "කතාබහ" නමින් කොළමක් ලිව්වෙමි. ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික පුවත්පතක පළ වූ මුල්ම කොළම වන මෙය ඉතා ජනප්‍රිය වූ බැවින් පසුව අප ආරම්භ කළ පහන පුවත්පතටද එය ගෙන ආවෙමි. "කතාබහ" තුළින් මා කතා කළේ එදිනෙදා සමා-ජයේ මගේ ඇස ගැටෙන සිදුවීම් පිළිබඳවය. සමහර සිදුවීම් දෙස හාස්‍යයෙන් ද තවත් සමහර සිදුවීම් දෙස කම්පාවෙන්ද බලා සිටි මගේ අතින් ලියැවුණ මේ සටහන් අගය කළ බොහෝ දෙනෙක් සිට නමුත් කීප දෙනකු ඒ පිළිබඳ නොපහන් සිතින් සිටිය බව මම දැන සිටියෙමි.




සමාජය දෙස විවේචනාත්මක දෘෂ්ඨියකින් බලා යමක් ලිවීම ඉතා වෙහෙසකර කටයුත්තක් බවට පත්ව ඇත්තේ සටහනේ මුඛ්‍ය අර්ථය තේරුම් ගන්නට අසමත් අර මා කලින් කියූ සුලුතරය නිසා ය. ඔවුන් කියවා තේරුම් ගන්නේ ලේඛකයා ලියූ දේ නොව තමන්ට තේරුම් ගන්නට අවශ්‍ය වෙනත් මොකක් හෝ දෙයකි. එපමණකින් නොනැවතී තමන් වැරදි ලෙස වටහා ගත් සටහන් පිළිබඳ මහා හා හෝවක් කරන්නටත් මේ උදවියට හැකිය. එයින් තමන්ගේ නොදැනුවත් බව එළිදරව් වෙන බවවත් තේරුම් ගන්නට තරම් බුද්ධියක් මේ බොහෝ අයට නැත. ඉදින් වසර ගණනක දුෂ්කර ක්‍රියාවකින් පසු මම "කතාබහ"ලිවීම නවතා දැමුවෙමි. "කතාබහ" නැවත අරඹන්නැයි බොහෝ දෙනා ඉල්ලා සිටි නමුත් නෑසූකන්ව සිටියෙමි.

මේ අතීතය මට සිහිපත් වූයේ මට කළ නොහැකි මේ දුෂ්කර කාර්යය සිය ජීවිත කාලය පුරාවටම කරගෙන යන ඩී බී කුරුප්පු නම් වන වියත් ලේඛකයාගේ " සිංගරු සිරිත" පොතේ නව සංස්කරණය කියවන විට ය.

වචනාර්ථයෙන්ම කියැවෙන පරිදි " සිංගරු සිරිත" පොතේ කතාබහ කෙරෙන්නේ කැන්ගරු දේශයට ආ සිංහලයන්ගේ - සිංගරුවන්ගේ - තොරතුරු ය. වගතුග ය. හපන්කම් සහ මෝඩකම් ය. ඩී බී කුරුප්පු ශූරීන්ගේ වියත් බසින් රසවත්ව ලියැවුණ මේ අගනා පොත නැවත නැවතත් කියවන්නට සිතෙන්නේ එය හුදු වාර්තාවක් පමණක් නොවී අපට නැවත නැවත සිතන්නට යමක් ද ඉතිරි කරන නිසා ය.

ඩී බී කුරුප්පු සිංගරු සමාජය ව්‍යවච්ඡේදනය කර ඒ තුළ දකින්නට ලැබෙන සියල්ල සංග්‍රහ කරයි. සාහිත්‍යය සංගීතය නර්තනය වේදිකාව පිළිබඳව පමණක් නොව ව්‍යාපාර පිළිබඳව පවා ඔහු කතා කරයි. ඉතා පරෙස්සමෙන් එක්රැස් කරගත් තොරතුරු රැසක් ලේඛණ ගත කරයි. මේ සමාජය පිළිබඳ යම් හැදෑරීමක් කරන අයෙකුට මේ තොරතුරු අතිශය වැදගත් වනු නියත ය.

පොතේ සඳහන්ව ඇති සමහර සිදුවීම් දෙස ඩීබී බලන්නේ උපේක්ෂවෙනි. තවත් ඒවා ඔහුගේ හාස්‍යයට හේතුවෙයි. තවත් විටෙක ඒ සිදුවීම් තුළින් ඔහු ලද කම්පනය සටහන් වෙයි. මේ සියල්ල කියවන අප සිතේද එලෙසම ජනිත කරන්නට ඔහුගේ අතිශය පොහොසත් භාෂාවට හැකි ය. එහිදී අපට ඔහුගෙන් ඉගෙනගන්නට ඇති දෑ අපමණ යයි මට සිතෙයි.

අප මිත්‍ර විජය වික්‍රම කරුණාසේන ගේ පිට කවරයද මනරම් ය. දක්ෂ සිත්තරකු වන ඔහු පින්සල පසෙක තබා කල් ගත කිරීම පාඩුවකි. (මේ පොතට සමගාමීව නිකුත් වී ඇති ඩී බී කුරුප්පු මහතාගේම Village Life and Beyond ඉංග්‍රිසි පොතේ විජය ඇඳ ඇති රූප පෙළ මා කලකට පසු පොතක දුටු හොඳම රූප පෙළයි.) අද කලා ක්ෂේත්‍රයේ දස්කම් දක්වන බොහෝ අය ඉංජිනේරුවන් වීම අපේ සිතේද ඇති කරන්නේ මහත් සතුටකි.

"සිංගරු සිරිත" මාතෘකා 47 කින් සමන්විත ය. ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික සමාජයේ සිදුවන සියළුම ක්‍රියාකාරකම් පිළිබඳව කතා කරනවාට අමතරව ඔහුගේ නිරීක්ෂණයට ලක්වන ඇතැම් සිදුවීම් පිළිබඳවද ඩීබී ලියයි. ඒ අතරම ශ්‍රී ලංකාවේ පැල පදියම් වී ඇති දුර්ගුණ මේරටට කාන්දු කරන්නට දැරෙන වැර වෑයම්ද ඔහුගේ ඇසින් නොගැළවෙයි.

"බෝධි පූජාව" පරිච්ඡේදයේ ඔහු ලියන මේ කොටස කියවා බලන්න.

*"එ පමණක් නොවේ. දැන් විලාසිතාව වනුයේ ශ්‍රී ලංකාවේ නායකයන්ගේ උපන්දින නිමිති කර ගෙන බෝධි පූජා පවත්වා ඔවුන්ට දිගාසිරි පැතීම ය............*
*...... දැන් දැන් මේ රටටත් පරණ දේශපාලනයේ අතවර වලට ගොදුරු වන්නට සිදුවන බවට මෙය හොඳම නිදසුනකි.*
*මේ පින් බලාගෙන කරන දෙයක් නොවේ. ලකුණු දමා ගන්නට කරන ආවැඩීමකි. සුවය පතනුයේද ලෙඩාට නොහොත් ආතුරයාට නොවේ. කරන කරවන අයටය. වැඩියෙන්ම කරවන අයට ය."*

බඩගෝස්තරවාදය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන පිළිල මේ රටට බෝ කරන්නට වැර වෑයම් කරන දෙතුන් දෙනා මේවා කියවිය යුතුය. විනාශයක් කළාට පසු නැවත හදන්නට අපහසුය. විනාශය වන්නට පෙර වළක්වාගන්නට මෙවැනි සටහන් අතිශය වැදගත් ය. එහෙත් බඩ වඩා ගැනීම පළමු තැන ලෙස සළකන දේශපාලන එහෙයියන් මේවා වටහා ගනිතැයි බලා සිටීම මුළාවකි.

ඩීබී අනලස්ව ලියයි. ඒවා කියවා තේරුම් ගැනීම හෝ නොගැනීම සමාජයට පවරා ඔහු හිස පහත් කරගත්වනම ලියයි. තේරුම් ගන්නෝ තේරුම් ගනිත්වා. නොගන්නන් ගැන වෙහෙසෙන්නේ කුමටද?

"සිංගරු සිරිත" ඕස්ට්‍රේලියා වාසී සෑම ශ්‍රී ලාංක-කයකුගේම නිවසේ තිබිය යුතු පොතකි. ඔවුන් විසින් නැවත නැවත කියවනු ලැබිය යුතු පොතකි.

ඩී බී කුරුප්පු අපේ සමාජයට සම්පතකි.




